සියලු ම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

| 33 | S | I |
|---|---|---|

**Royal College - Colombo 07**

රාජකීය විද්‍යාලය - කොළඹ 07

**Grade 11 – First Term Test – June 2021**

**පළමු වාර පරීක්ෂණය - 2021 ජුනි - 11 ශ්‍රේණිය**

කාලය : පැය 1
**Time: 1 hour**

# History - I

## ඉතිහාසය - I

Name:- .......................................... Class: -.......................... Index no: - ...................................

<u>සැලකිය යුතුයි</u>

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්න වලට දී ඇති 1, 2, 3, 4 යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.
- **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුල (×) යොදන්න.**

01) වංසත්ථප්පකාසිනි කෘතිය රචනා කරනු ලැබුවේ,
   1) ශ්‍රී ලංකාවේ රාජ වංශ පිළිබඳව තොරතුරු දැක්වීමට.
   2) සිංහද්වීපයේ වංශ කතාව ගෙන හැර දැක්වීමට.
   3) මහා වංශයට ටීකාවක් ලෙස.
   4) මෙරට ශාසන ඉතිහාසය ගෙනහැර දැක්වීමට.

02) පුරා විද්‍යාත්මක මූලාශ්‍රයක් වන සෙල් ලිපි සම්බන්ධව නිවැරදි ප්‍රකාශයක් නොවන්නේ,
   1) මෙරට ඉතිහාසය අඛණ්ඩව ලියවී ඇත.
   2) වංශ කතාවල සඳහන් ඇතැම් තොරතුරු සෙල් ලිපි වලින් සනාථ වේ.
   3) මුල් කාලීන සෙල් ලිපි බ්‍රාහ්මී අක්ෂර වලින් ලියවී ඇත.
   4) සෙල් ලිපි වල සඳහන් තොරතුරු සමකාලීන වේ.

03) මෙරට දක්නට ලැබෙන සෙල් ලිපි අතුරෙන් පැරණිම ලිපි වර්ගය වන්නේ,
   1) ගිරි ලිපි   2) ලෙන් ලිපි   3) ටැම් ලිපි   4) ආසන ලිපි

04) මෙරටින් ලැබී ඇති පැරණිම කාසි වර්ගය වන්නේ,
   1) ඇතා සහ ස්වස්තික කාසිය.   2) තඹ මස්ස
   3) ලක්ෂ්මී කාසිය   4) 'කහාපණ' නම් කාසිය

05) මෙතෙක් සිදු කර ඇති පර්යේෂණ වලට අනුව ප්‍රාග් ඓතිහාසික මානවයා පිළිබඳ පැරණිම තොරතුරු ලැබෙන්නේ,
   1) උඩමළල කැණීම් වලින්   2) පාහියන්ගල කැණීම් වලින්
   3) කිතුල්ගල බෙලිලෙනෙන්   4) බෙල්ලන් බැඳි පැලැස්සෙන්

06) මිනිහාගල්කන්ද, බුන්දල හා පතිරාජවෙල යනු,
   1) මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ඇතිවූ ස්ථාන වේ.
   2) ප්‍රාග් ඓතිහාසික මානවයාගේ වෙරළාශ්‍රිත එළිමහන් වාසස්ථාන වේ.
   3) ප්‍රාග් ඓතිහාසික මානවයාගේ තෙත් කලාපීය ලෙන් පිහිටි ස්ථාන වේ.
   4) ප්‍රාග් ඓතිහාසික මානවයා විසූ වියළි කලාපීය ලෙන් පිහිටි ස්ථානයි.

07) සීගිරියේ දක්නට ලැබෙන බිතු සිතුවම් පිළිබඳව පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් නොගැලපෙන ප්‍රකාශය කුමක්ද ?
1) ක්‍රි.ව. පස්වන සියවසේ රාජකීය කාන්තාවන්ගේ ඇඳුම් පැළඳුම් හා ආභරණ පිළිබඳව අවබෝධයක් ලැබේ.
2) සීගිරි බිතු සිතුවම් හා අජන්තා ලෙන් සිතුවම් අතර සමානාත්මතාවයක් ඇති බව හෙළිවී ඇත.
3) අතීත ශිල්පීන් චිත්‍ර ඇඳීමේදී භාවිතා කළ වර්ණ පිළිබඳ අවබෝධයක් ලබා ගත හැකිය.
4) සීගිරියේ පැවති ජල තාක්ෂණය පිළිබඳව තොරතුරු ලැබේ.

08) පූර්ව ඓතිහාසික යුගයේ අභිචාර විධි පිළිබඳව තොරතුරු ලැබෙන ස්ථානයකි,
1) හල්දුම්මුල්ල 2) රාවණා ඇල්ල 3) සීගිරිය පොතාන 4) මානියම්ගම

09) ගංගා නිම්න වලට පිටතින් පිහිටා තිබූ ජනාවාස ගංගා නිම්න තුලට අවතීර්ණ වූ බවට තොරතුරු ලැබෙන්නේ,
1) කිරිඳි ඔය නිම්නයෙනි. 2) අඹන් ගඟ නිම්නයෙනි.
3) කලා ඔය නිම්නයෙනි. 4) අනුරාධපුරයෙනි.

10) දේවානම්පියතිස්ස රජුගේ රාජ්‍ය සමය වන විට බලය මධ්‍යගතවීමේ අවශ්‍යතාවය පැන නැගීමට බලපෑ හේතුව වූයේ,
1) ප්‍රාදේශීය පාලකයින් අතර ගැටුම් ඇතිවීම නිසා.
2) විදේශ ආක්‍රමණ වලට මුහුණදීමේ ඒකීය රටක් ලෙස ක්‍රියා කිරීම වැදගත් වීම.
3) ඉන්දියන් සාගරයේ දියුණුවෙමින් පැවති ජාත්‍යන්තර වෙළඳාමට සම්බන්ධ වීමේදී ඒකීය රටක් ලෙස කටයුතු කිරීම වැදගත් වීම.
4) පරුමකවරුන්ගෙන් මධ්‍යම රජයට එල්ලවූ අභියෝග මැඩපැවැත්වීමට.

11) පහත දැක්වෙන සිදුවීම් සිදුවූ ඓතිහාසික කාල අනුපිළිවෙල අනුව පෙළගැස්වූ විට පිළිතුර තෝරන්න.
A - වසභ රජතුමා රට ආස්ථාන වලට බෙදා පරිපාලනය විධිමත් කිරීම.
B - නිශ්ශංකමල්ල රජතුමා හේන් වලින් අය කළ බදු අහෝසි කිරීම.
C - පණ්ඩුකාභය රජු ග්‍රාම සීමා නියම කිරීම.
D - දුටුගැමුණු රජු සතර දොරටුවේ දන්සැල් පැවැත්වීම.

1) A C D B 2) C D A B 3) D C A B 4) A B C D

12) පළමුවන විජයබාහු රජතුමා කාළිංග දේශය සමග විවාහ සබඳතා ඇති කර ගැනීමේ අරමුණ වූයේ,
1) කාළිංග හා පාණ්ඩ්‍යය වංශිකයන් සමග ඥාති සම්බන්ධතා ඇති කර ගැනීමේ අරමුණෙන්.
2) පාණ්ඩ්‍ය හා කාළිංග යන රට වලින් යුධ ආධාර ලබා ගැනීමට.
3) දේශපාලන බලය ස්ථාවරව පවත්වා ගැනීමට.
4) පාණ්ඩ්‍ය දේශයෙන් හා කාළිංග දේශයෙන් ආර්ථික ආධාර ලබා ගැනීමට.

13) දුටුගැමුණු රජතුමා ජනතාව වෙත දැක්වූ සහනශීලී ආකල්පය පිළිබිඹු වන අවස්ථාවක් ලෙස සැලකිය හැක්කේ,
1) තමා හා සටන් කොට මියගිය එළාර රජු වෙනුවෙන් ස්මාරකයක් ඉදිකිරීම.
2) මිරිසවැටිය චෛත්‍ය ඉදිකිරීම.
3) රුවන්වැලි සෑය ඉදිකිරීමට සහභාගිවූවන්ට වැටුප් ගෙවීම.
4) වැව් අමුණු ඉදිකිරීම.

14) පැරණි සමාජයේ දියුණු වෛද්‍ය තාක්ෂණයක් පැවති බවට ලැබෙන ප්‍රබලම සාක්ෂියකි,
1) බුද්ධදාස රජතුමා සතුන්ට පවා වෙදකම් කළ වෛද්‍යවරයෙකු වීම.
2) උණ රෝගීන් සඳහා විශේෂ රෝහලක් පැවති බවට මූලාශ්‍ර වල සඳහන් වී තිබීම.
3) ආලාහන පිරිවෙන අසලින් ශල්‍ය උපකරණ හමුවීම.
4) අතීතයේ වෙද පොත් තිබූ බව හා ඔසු උයන් පැවති බවට සාක්ෂි ලැබීම.

15) මුල් ඓතිහාසික යුගයේ ජනාවාස වියළි කලාපය ආශ්‍රිතව ව්‍යාප්ත වීමට බලපෑ ප්‍රධානම හේතුව ලෙස සැලකිය හැක්කේ,
1) රතු දුඹුරු පස වියළි කලාපයේ වැඩි ප්‍රදේශයක ව්‍යාප්තව පැවතීම.
2) වියළි කලාපයේ විශාල වැව් ඉදිකර තිබීම.
3) මිලි මීටර 2500 – 1000 අතර වර්ෂාපතනයක් ලැබීම.
4) අවුරුද්ද පුරාම කෘෂිකර්මාන්තය සඳහා අවශ්‍ය ජලය ලබාගැනීමේ පහසුව.

16) අපරාධකරුවෙකු අල්ලා ගන්නාතුරු ඔහු ජීවත් වූ ගමේ වැසියන් රජයට ගෙවිය යුතු බද්ද හැඳින්වූයේ,
   1) මතරමජිබක යනුවෙනි.
   2) 'මාසාත නීතිය' ලෙසයි.
   3) 'ගෘහදණ්ඩ' යනුවෙනි.
   4) කෙටු කනබ බද්ද ලෙසයි.

17) කොණ්ඩවට්ටවාන් සෙල් ලිපියට අනුව නිසි කලට වගා නොකරන පුද්ගලයින්ගෙන් දඩ මුදල් අය කිරීමට හේතුව කුමක්ද ?
   1) මෙරට ප්‍රධාන ජීවනෝපාය වී ගොවිතැන වීම.
   2) කෘෂිකාර්මික කටයුතු සාර්ථකව පවත්වාගෙන යා යුතු වීම.
   3) වැසි කාලයේ සී සෑම නිසා පස සෝදා යාමට ලක්වීම.
   4) කෘෂිකර්මාන්තයේ යෙදීම සෑම පුද්ගලයෙකු විසින්ම සිදු කළ යුතු වීම.

18) අභයගිරිය අසලින් 'රන් දෙව්සි කළ ද' යැයි සඳහන් රන් කැබැල්ලක් ලැබීම තුලින් හෙළිවන කරුණ කුමක් ද?
   1) අතීතයේ පැවති ලෝහ තාක්ෂණය.
   2) අතීත සමාජය රන් රිදී වැනි ලෝහ භාවිතයෙන් ආභරණ නිපදවූ බව.
   3) එම යුගයේ පැවති ආර්ථික සමෘද්ධිමත් භාවය.
   4) විනිමය කටයුතු වලදී කාසි වෙනුවට ලෝහ බර භාවිතා කළ බව.

19) අතීතයේ කන්න තුනක් වී වගා කළ බවට තොරතුරු ලැබෙන මූලාශ්‍රය වන්නේ,
   1) පනාකඩුව තඹ සන්නස.
   2) තෝනිගල සෙල් ලිපිය.
   3) කොණ්ඩවට්ටවාන් සෙල් ලිපිය.
   4) වේවැල්කැටිය සෙල් ලිපිය.

20) ලීලාවතී බිසව පොළොන්නරුවේ තුන්වරක් රාජ්‍යත්වයට පත්වීම, කල්‍යාණවතී බිසවද පොළොන්නරුවේ රජවීම යන සිදුවීම් වලින් පැහැදිලි දේශපාලන කරුණ වන්නේ,
   1) කල්‍යාණවතී බිසවට වඩා ලීලාවතී බිසව ජන ප්‍රසාදයට පත්වූ බව.
   2) පොළොන්නරුවේ රාජ්‍ය බලය ලබා ගැනීමට කාලිංග හා පාණ්ඩ්‍යය වංශිකයන් අතර පැවති බල අරගලය.
   3) අතීත සමාජයේ කාන්තාවන්ට ඉහළ තැනක් හිමි වූ බව.
   4) රාජ්‍ය පාලනය සඳහා කාන්තා නියෝජනය ඉහළ මට්ටමක පැවති බව.

21) පහත A තීරුවේ සිදුවීම් B තීරුවේ සඳහන් රජවරුන් සමග ගැලපූවිට නිවැරදි පිළිතුර වන්නේ,

| A | B |
|---|---|
| 1) ඊජිප්තුව සමග විදේශ සම්බන්ධතා පැවැත්වීම. | A. හයවන බුවනෙකබාහු රජතුමා |
| 2) සිංහල සංගෙ නම් කැරැල්ලක් ඇතිවීම. | B. ඉළනාග රජතුමා |
| 3) කිරිදි ඔය හරහා අමුණක් බැඳීම. | C. පළමුවන බුවනෙකබාහු රජතුමා |
| 4) උස්බිම්වල ලඳු කැලෑ නොකැපීමට නියෝග කිරීම. | D. හතරවන මිහිඳු රජතුමා |

   1. B C A D
   2. A B C D
   3. C A B D
   4. C D A B

22) ගම්පොළ රාජධානි සමයේ සිදුවූ සිදුවීම් කිහිපයක් පහත දැක්වේ. ඉන් නොගැලපෙන ප්‍රකාශය තෝරන්න.
   1) රජුගේ සහෝදරියගේ පුතාට රජකම හිමිවීම.
   2) බලවත් ප්‍රභූ පවුල් දෙකක් රජු හා සම්බන්ධව සිටීම.
   3) ආර්ය චක්‍රවර්තී බලවත් වීම.
   4) දළදා වහන්සේ පාණ්ඩ්‍ය රජු විසින් පැහැර ගැනීම.

- **23 - 24 ප්‍රශ්න සඳහා පහත දැක්වෙන A, B, C, D, E වලින් දක්වා ඇති තොරතුරු උපයෝගී කර ගන්න.**

A. බෙලිගල පර්වතය මුදුනේ දළදා මන්දිරයක් කරවීම.
B. කපු වගාව දියුණු කිරීමට කටයුතු කිරීම.
C. දන්තුරේ සටනින් පෘතුගීසීන් පරාජය කිරීම.
D. පෘතුගීසීන් පළවා හැරීමට ලන්දේසීන්ගේ සහය ලබා ගැනීම.
E. ඌව රන්දෙණිවෙල සටනින් පෘතුගීසීන් පරාජය කිරීම.

23) ඉහත සඳහන් තොරතුරු වලින් පළමුවන විමලධර්මසූරිය රජු පිළිබඳ තොරතුරු පමණක් ඇතුලත් වන්නේ,
   1) A සහ C
   2) B සහ D
   3) C සහ E
   4) B සහ C

24) දෙවන රාජසිංහ රජු පිළිබඳව තොරතුරු පමණක් ඇතුලත් වන්නේ,
1) A සහ C 2) C සහ D 3) D සහ E 4) A සහ E

25) පෘතුගීසීන් හා යාපනය රාජ්‍ය අතර ගැටුම් ඇතිවීමට බලපෑ හේතු අතර නොගැලපෙන ප්‍රකාශය වන්නේ,
1) වීදිය බණ්ඩාර යාපනයට පලා ආ අවස්ථාවේ ඔහුට රැකවරණ සැපයීම.
2) මන්නාරම පෘතුගීසි බලකොටුව නිසා යාපනය රාජ්‍යයට මුතු කිමිදීමෙන් ලැබුණු ආදායම අහිමිවීම.
3) සංකිලි රජු කතෝලික ආගම පැතිරවීමට බාධා කිරීම.
4) කුරුඳු, ගම්මිරිස් වැනි කුළුබඩු යාපනයෙන් ලබා ගැනීමේදී පෘතුගීසීන්ට බාධා එල්ලවීම.

- **26 සහ 27 ප්‍රශ්න වලට පහත දැක්වෙන තොරතුරු අදාළ කර ගන්න.**

A - පූජාවලිය
B - දළදා සිරිත
C - කව් සිළුමිණ
D - සැළලිහිණි සංදේශය
E - බුදුගුණාලංකාරය
F - පන්සිය පනස් ජාතකය

26) ඉහත සඳහන් සාහිත්‍ය ග්‍රන්ථ අතුරෙන් කුරුණෑගල යුගයේ ලියවුණු ග්‍රන්ථ පමණක් ඇතුලත් පිළිතුර තෝරන්න.
1) B සහ F 2) A සහ F 3) B සහ E 4) B සහ C

27) ඉහත සඳහන් සාහිත්‍ය ග්‍රන්ථ අතුරෙන් දඹදෙණි යුගයේ ලියවුණු ග්‍රන්ථ පමණක් ඇතුලත් පිළිතුර වන්නේ,
1) A සහ C 2) B සහ D 3) C සහ E 4) D සහ F

28) සූප ශාස්ත්‍රයෙහි දක්ෂ කාන්තාවන් ‘මධු පාචිකා’ යන විශේෂ ගෞරව නාමයෙන් හැඳින්වූ බව සඳහන් වන්නේ,
1) සැළලිහිණි සංදේශයේ 2) රසවාහිනියේ
3) සද්ධම්මාලංකාරයේ 4) දම්පියා අටුවා ගැටපදයේ

29)

| | | | | | |
|---|---|---|---|---|---|
| A | දෙවෙනි රාජසිංහ රජු | D | පිළිමතලාවේ මහාධිකාරම් | G | 1638 ගිවිසුම |
| B | කීර්ති ශ්‍රී රාජසිංහ රජු | E | මහා අස්ථාන කුමරු | H | පත්තිරිප්පුව ඉදිකිරීම |
| C | ශ්‍රී වික්‍රම රාජසිංහ රජු | F | සියම් නිකාය ආරම්භ වීම | J | උපාලි හිමියන් ප්‍රමුඛ සංඝයන් මෙරටට වැඩම කිරීම |

ඉහත සඳහන් තොරතුරු නිවැරදිව ගැලපූ විට නිවැරදි පිළිතුර වන්නේ,
1) B E H, A D H, C F J 2) C E H, B D G, A F H
3) A E G, B F J, C D H 4) A E J, B F H, C D G

- පහත දැක්වෙන ඓතිහාසික සිදුවීම් ඇසුරෙන් 30 සහ 31 යන ප්‍රශ්න වලට පිළිතුරු සොයන්න.

A - චෙං හෝ සෙනවියාගේ ආක්‍රමණය සිදුවීම.
B - කාලිංගරායර හා චෝඩගංගගේ ආක්‍රමණය.
C - ජයවර්ධනපුර බලකොටුව ඉදිකිරීම.
D - සුනේත්‍රාදේවි පිරිවෙන ඉදිකිරීම.
E - කාලිංග මාඝ පරාජය කිරීම.
F - යාපනය රාජ්‍යය අවසන් වතාවට මධ්‍යම රජයට යටත් වීම.

30) ගම්පොළ රාජධානි සමයේ සිදුවූ සිදුවීම් පමණක් දැක්වෙන පිළිතුර වන්නේ,
1) A සහ C 2) B සහ F 3) C සහ E 4) B සහ C

31) කෝට්ටේ රාජධානි සමයට අයත් සිදුවීම් පමණක් දක්නට ලැබෙන පිළිතුර වන්නේ,
1) B සහ D 2) C සහ D 3) D සහ F 4) E සහ F

32) ක්‍රිස්තු වර්ෂ 1594 දන්තුරේ සටන සිදුවූයේ,
1) පළමුවෙනි විමලධර්මසූරිය රජු හා ද ලසර්දා අතරය.
2) මහ අස්ථාන කුමරු, සෙනෙරත් රජු හා දියෝගු ද මේලෝ අතරය.
3) පළමුවෙනි විමලධර්මසූරිය රජු හා පේරෝ ලෝපේස් ද සූසා අතරය.
4) දෙවන රාජසිංහ රජු සහ දොන් ජෙරනිමෝ ද අසවේදු අතරය.

33) ඉංග්‍රීසීන් ශ්‍රී ලංකාවේ මුහුදුබඩ පළාත් අත්පත් කර ගන්නා විට උඩරට පාලකයාව සිටියේ,
1) සේනා සම්මත වික්‍රමබාහු රජතුමා
2) දෙවන රාජසිංහ රජතුමා
3) රාජාධිරාජසිංහ රජතුමා
4) ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා

34) බ්‍රිතාන්‍ය ජාතිකයින්ගේ අවධානය ශ්‍රී ලංකාව කෙරෙහි යොමුවීමට බලපෑ කරුණක් නොවන්නේ,
1) ත්‍රිකුණාමලය මෝසම් සුළං කාලවලදී බ්‍රිතාන්‍ය නැව් වල ආරක්ෂාව සඳහා සුදුසු වීම.
2) කතෝලික ආගම ප්‍රචාරය සඳහා ශ්‍රී ලංකාවට පැමිණීම.
3) ඉන්දියාවේ නැගෙනහිර වෙරළේ නාවික කටයුතු ත්‍රිකුණාමලය වරායේ සිට කර ගැනීමට.
4) ශ්‍රී ලංකාවෙන් කුරුඳු වැනි කුළුබඩු ලබා ගත හැකි වීම.

35) ශ්‍රී ලංකාවේ ජාතික පුනරුදය පිළිබඳව තොරතුරු සඳහන් වන යුගල කිහිපයක් පහත දක්වා ඇත. ඉන් නොගැලපෙන යුගලය කුමක්ද ?
1) බුද්ධගයාව වැනි පූජනීය ස්ථාන ආරක්ෂා කිරීම - අනගාරික ධර්මපාල තුමා
2) වෙසක් පොහොය නිවාඩු දිනයක් කිරීම - හෙන්රි ස්ටීල් ඕල්කට් තුමා
3) ලංකෝපකාර මුද්‍රණාලය පිහිටුවීම - ධර්මාලංකාර සිරි සුමනතිස්ස හිමි
4) මාළිගාකන්දේ විද්‍යෝදය පිරිවෙන - පූජ්‍ය වලානේ සිද්ධාර්ථ හිමි

36) මිෂනාරී සමාගම් මගින් ආරම්භ කළ අධ්‍යාපන ආයතන වලට එරෙහිව දේශීය අධ්‍යාපනය නගා සිටුවීමට ගත් වැදගත්ම ක්‍රියාමාර්ගය වූයේ,
1) ස්ව භාෂා අධ්‍යාපනය නගා සිටුවීම.
2) පොත් පත් හා පත්‍රිකා මුද්‍රණය කර බෙදා හැරීම.
3) ඉංග්‍රීසි මාධ්‍ය අධ්‍යාපනය ලබා දෙන බෞද්ධ පාසල් පිහිටුවීම.
4) විදේශ රටවලට දරුවන් යවා ඉංග්‍රීසි අධ්‍යාපනය ලබා දීම.

37) මියුරන් කොමිසම පත් කරනු ලැබුවේ,
1) 1818 නිදහස් අරගලය පිළිබඳව සොයා බැලීමට.
2) 1848 නිදහස් අරගලය පිළිබඳව සොයා බැලීමට.
3) 1797 – 98 මුහුදුබඩ පළාත් වල සිදුවූ බදු විරෝධී කැරැල්ල පිළිබඳව සොයා බැලීමට.
4) ග්‍රාමීය කෘෂිකර්මාන්තය පිළිබඳව සොයා බැලීමට.

38) යුරෝපයේ පුනරුදය පිළිබඳව පහත දැක්වෙන ප්‍රකාශ වලින් නොගැලපෙන ප්‍රකාශය කුමක්ද ?
1) ප්ලොරන්ස් නගරයේ ජීවත් වූ මෙඩිසි පවුල කලාව සඳහා අනුග්‍රහය දැක්විය.
2) ඇලෙක්සැන්ඩ්‍රියා, ලිස්බන් වැනි දියුණු වෙළඳ නගර බිහිවිය.
3) කොන්ස්තන්තිනෝපලය බිඳ වැටීම පුනරුදයට ප්‍රධාන හේතුවයි.
4) පුනරුද සමයේදී චිත්‍ර කලාවේ විශාල පරිවර්තනයක් සිදුවිය.

39) කාර්මික විප්ලවය සම්බන්ධව පහත දැක්වෙන සිදුවීම් වලට අදාළ පුද්ගලයින් නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.
- ස්පිනිං ජෙනි යන්ත්‍රය
- වාෂ්ප එන්ජිම
- ජෙලි වැපිරීමේ ක්‍රමය
- ආරක්ෂක ලාම්පුව

1) ජෙන් රෝටල්, රොබට් බැක්වෙල්, හම්ප්‍රි ඩේවි, ජේම්ස් වොට්
2) ජේම්ස් හාග්‍රිව්ස්, ජෙන් රෝටල්, ජේම්ස් වොට්, හම්ප්‍රි ඩේවි
3) ජේම්ස් හාග්‍රිව්ස්, ජේම්ස් වොට්, ජෙන් රෝටල්, හම්ප්‍රි ඩේවි
4) ජෝන් කේ, ජේම්ස් හාග්‍රිව්ස්, ජෙන් රෝටල්, ජේම්ස් වොට්

40) කාර්මික විප්ලවය එංගලන්තයෙන් ආරම්භ වීමට ප්‍රබලම හේතු වූයේ,
1) අමුද්‍රව්‍ය එරට බහුල වීම.
2) ගොඩබිම හා ජලයේ ප්‍රවාහනය දියුණු වීම.
3) බැංකු හා මූල්‍ය කටයුතු දියුණු වීම.
4) බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයක් වීම.

සියලු ම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

Royal College - Colombo 07
රාජකීය විද්‍යාලය - කොළඹ 07

| 33 | S | II |
|---|---|---|

Grade 11 – First Term Test – June 2021

කාලය : පැය 3
Time: 3 hours

පළමු වාර පරීක්ෂණය - 2021 ජුනි - 11 ශ්‍රේණිය

# History - II
## ඉතිහාසය - II

Name:- .......................................... Class: -........................... Index no: - ....................................

<u>සැලකිය යුතුයි</u>

- I කොටසේ පළමුවැනි ප්‍රශ්නය අනිවාර්ය වේ.
- II කොටසින් ප්‍රශ්න හතරකට ද, III කොටසින් ප්‍රශ්න එකකට ද පිළිතුරු සපයන්න.
- **පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.**

## <u>I කොටස</u>

01) (අ) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ද (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ද ලකුණු කර නම් කරන්න.

(i) දැදුරු ඔය, ගල් ඔය, ලංකාපටුන, හලාවත, කන්දරෝඩය, කෝට්ටේ, පොම්පරිප්පු, උඩමළල, කලාවැව, ගන්නෝරුව, මහියංගනය, ගොඩවාය (ල. 12)

(ii) බ්‍රිතාන්‍ය, මධ්‍යධරණී මුහුද, රෝමය, බතාවිය, මලක්කා සමුද්‍ර සන්ධිය, ග්‍රීසිය (ල. 06)

(ආ) (i) පහත සඳහන් A, B, C, D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරු වලට අදාළ පිළිතුරු අනුපිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

A - ශ්‍රී ලංකාව සෙරන්ඩිබ් නමින් හැඳින්වූ ජන වර්ගය.
B - බයිබලය ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කළ පුද්ගලයා.
C - පෘතුගීසීන් විසින් යාපනය රාජ්‍යයට පත් කළ ඔවුන්ට පක්ෂපාති පාලකයා
D - තිලෝක සුන්දරි කුමරිය විවාහ කර ගත් මෙරට පාලකයා (ල. 04)

A හා B යටතේ දක්වා ඇති රූප අධ්‍යයනය කර අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු අංක අනු පිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

A.



(ii) 1) 'A' වලින් දැක්වෙන්නේ මොනවාද ?
2) මේවා සොයා ගත් ස්ථානය නම් කරන්න.
3) මෙම උපකරණ භාවිතා කරනු ලැබුවා යැයි සැලකෙන කාර්යය කුමක්ද ?
4) මෙම නිර්මාණ ඇසුරෙන් පැරණි සමාජය පිළිබඳව ලැබෙන තොරතුර කුමක්ද ? (ල. 04)

B.



(iii) 1) B රූපයේ සිටින තැනැත්තා නම් කරන්න.
2) ඔහු සිදුකළ නව නිපදවීම කුමක්ද ?
3) එම නිපදවීම නිසා දියුණු වූ ක්ෂේත්‍රය කුමක්ද ?
4) මෙම පුද්ගලයාගේ ජීවිතය පිළිබඳව සුවිශේෂී ලක්ෂණය කුමක්ද ? (ල. 04)

## II කොටස

02) (i) ඉතිහාසය හැදෑරීමේ මූලාශ්‍රයක් ලෙස යොදා ගත හැකි පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය බෙදෙන කොටස් 3 නම් කරන්න. (ල. 3)

(ii) චිත්‍ර හා මූර්ති අධ්‍යයනය මගින් අපේ ඉතිහාසය පිළිබඳව තොරතුරු ලැබෙන අංශ 4ක් ලියන්න. (ල. 4)

(iii) පුරා වස්තු යනු මොනවාදැයි නම් කර ඉතිහාසය හදාරන්නෙකුට පුරාවස්තු අධ්‍යයනයේ වැදගත්කම අංශ 2ක් යටතේ ලියන්න. (ල. 5)

(iv) පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය ආරක්ෂා කර ගැනීමේ වැදගත්කම අංශ 3ක් යටතේ විස්තර කරන්න. (ල. 6)

03) (i) ප්‍රාග් ඓතිහාසික යුගයේ මානවයා ජීවත් වූ පහතරට තෙත් කලාපීය ගල්ලෙන් 3ක් නම් කරන්න. (ල. 3)

(ii) පහත A සිට D දක්වා ප්‍රශ්න වලට අදාළ පිළිතුරු වරහන් තුළින් තෝරා අනුපිළිවෙලින් ලියන්න.

A - ප්‍රාග් ඓතිහාසික මානවයාගේ තෙත් කලාපීය එළිමහන් වාසස්ථානයකි.
B - මුල් කාලීන සෙල් ලිපි ලිවීමට භාවිතා වූ අක්ෂර මාලාව.
C - "දූහතර රජ" ලෙස හැඳින්වූ සෙල් ලිපිය.
D - වසභ රජුගෙන් පසු රාජ්‍යත්වය උරුම වීම.

(කූටකණ්ණ තිස්ස රජු, බ්‍රාහ්මී අක්ෂර, ඇඹුල් අඹේ, හෝර්ටන් තැන්න, වංකනාසික තිස්ස රජු, සංස්කෘත, යටහලෙන, බෙල්ලන්බැඳි පැලැස්ස) (ල. 4)

(iii) මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යාප්තවීමට බලපෑ සාධක 2ක් ලියා පැහැදිලි කරන්න. (ල. 5)

(iv) පූර්ව ඓතිහාසික යුගයේ මානවයාගේ තාක්ෂණය පිළිබඳව කරුණු 3ක් යටතේ විස්තර කරන්න. (ල. 6)

04) (i) පහත දැක්වෙන වැව් ඉදිකළ රජවරු නම් කරන්න.
A - කලා වැව -
B - අභය වැව -
C - මින්නේරිය වැව - (ල. 3)

(ii) පහත A, B, C, D වලින් දැක්වෙන පැරණි තාක්ෂණය හා සම්බන්ධ නිර්මාණ අනුපිළිවෙලින් නම් කරන්න.

A - ප්‍රාග් ඓතිහාසික මානවයින් සිය කාර්යයන් කර ගැනීමට නිපදවූ තාක්ෂණික උපකරණය -

B - පූර්ව ඓතිහාසික යුගයේ මැටි බඳුන් නිපදවීමට යොදා ගත් තාක්ෂණික උපකරණය -

C - සොරොව්වෙන් ජලය පිට කිරීමේදී පීඩනය පාලනය කිරීමට කරන ලද නිර්මාණය -

D - දැදිගම ඇත් පහන නිර්මාණය කිරීමේදී යොදා ගත් මූලධර්මය - (ල. 4)

(iii) (A) මහා වැව් නිර්මාණයේ පුරෝගාමී වූ රජු නම් කරන්න.
(B) එම රජු මහා වැව් ඉදිකිරීම සඳහා තීරණ ගැනීමට හේතු වූ කරුණු 2ක් පැහැදිලි කරන්න. (ල. 5)

(iv) අතීතයේ ශ්‍රී ලංකාවේ දියුණු යකඩ නිස්සාරණය කිරීමේ තාක්ෂණයක් තිබූ බවට ලැබෙන සාක්ෂි 2ක් විස්තර කරන්න. (ල. 6)

05) (i) දෙවන නාගරීකරණයේ ආරක්ෂිත ස්ථාන වල සිය පාලන මධ්‍යස්ථාන පිහිටුවා ගෙන සිටි නායකයින් 3 දෙනෙකු නම් කරන්න. (ල. 3)

(ii) දෙවන නාගරීකරණයේ රාජධානි වල ආර්ථිකයේ ලක්ෂණ 2ක් ලියන්න. (ල. 4)

(iii) උද්‍යාන අලංකරණය, ආරක්ෂාව වැනි කරුණු පදනම් කරගෙන සීගිරිය නිර්මාණය කළ බවට කරුණු 2ක් යටතේ පැහැදිලි කරන්න. (ල. 5)

(iv) පොළොන්නරු රාජධානිය බිඳවැටීමෙන් පසු මෙරට මහා පරිමාණ වාරි නිර්මාණ බිහිනොවීමට හේතුව කරුණු 3ක් යටතේ පැහැදිලි කරන්න. (ල. 6)

06) (i) මුහුදුබඩ පළාත් වල බ්‍රිතාන්‍ය පාලනය ක්‍රියාත්මක වූ ආකාර 3 ලියන්න. (ල. 3)

(ii) බ්‍රිතාන්‍ය ජාතිකයින් උඩරට රාජ්‍යය යටත් කර ගැනීමට බලපෑ හේතු 4 ක් ලියන්න. (ල. 4)

(iii) 1818 නිදහස් සටනට හේතු 3ක් දක්වා 2ක් විස්තර කරන්න. (ල. 5)

(iv) පෘතුගීසි හා ලන්දේසි ජාතිකයින් කිහිපවරක් වෑයම් කලත් උඩරට රාජ්‍යය අත්පත් කර ගැනීමට නොහැකි වීමට බලපෑ හේතු 3ක් පැහැදිලි කරන්න. (ල. 6)

07) (i) 1848 නිදහස් සටනට හේතු වූ කෝල්බෲක් ප්‍රතිසංස්කරණ 3 ක් ලියන්න. (ල. 3)

(ii) පහත සඳහන් තොරතුරු හා සම්බන්ධ පුද්ගලයින් නම් කරන්න.

A - මායාදුන්නේ රජුට උපකාර කළ කැලිකට් හි පාලකයා. -
B - 1795 දී උඩරට රජු හමුවූ ඉංග්‍රීසි ජාතිකයා -
C - දළදා මාළිගාවට පත්තිරිප්පුව එක් කළ රජතුමා -
D - මෙරට අවසාන සිංහල රජතුමා - (ල. 4)

(iii) පහත දැක්වෙන පුද්ගලයින් අතුරෙන් දෙදෙනෙකු පිළිබඳව ජාතික ආගමික පුනරුදයට දැක්වූ දායකත්වය විස්තර කරමින් ලියන්න.

A - අනගාරික ධර්මපාලතුමා -
B - හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා -
C - ආරුමුග නාවලර්තුමා -
D - සිද්ධි ලෙබ්බේ මහතා (ල. 5)

(iv) බෞද්ධ පුනරුද ව්‍යාපාරයේ ලක්ෂණ 3ක් දක්වා පැහැදිලි කරන්න. (ල. 6)

## <u>III කොටස</u>

08) (i) පුනරුදය නිසා දියුණුවට පත්වූ ඉතාලි නගර 3ක් ලියන්න. (ල. 3)

(ii) පුනරුදය සමග මුහුදු මාර්ග සොයා ගැනීමේ (දේශ ගවේෂණය) දියුණුවක් ඇති වීමට හේතු 4ක් ලියන්න. (ල. 4)

(iii) පුනරුද සමයේ යුරෝපයේ ආර්ථික ක්ෂේත්‍රයේ සිදුවූ වෙනස්කම් 2ක් දක්වා පැහැදිලි කරන්න. (ල. 5)

(iv) පුනරුදයේ බලපෑම නිසා ශ්‍රී ලංකාවේ ආර්ථික, දේශපාලන හා සමාජ සංස්කෘතික ක්ෂේත්‍ර වල සිදුවූ වෙනස්කම් විස්තර කරන්න. (ල. 6)

09) (i) කාර්මික විප්ලවය නිසා මුලින්ම දියුණු වූ ක්ෂේත්‍ර 3 නම් කරන්න. (ල. 3)

(ii) කාර්මික විප්ලවය නිසා (A) සන්නිවේදනය (B) ප්‍රවාහනය යන ක්ෂේත්‍ර වල සිදුවූ වෙනස්කම් 2 බැගින් ලියන්න. (ල. 4)

(iii) කාර්මික විප්ලවය නිසා යුරෝපා දේශපාලන ක්ෂේත්‍රයේ සිදුවූ වෙනස්කම් 2ක් පැහැදිලි කරන්න. (ල. 5)

(iv) කාර්මික විප්ලවය නිසා සිදුවූ අහිතකර බලපෑම් 3ක් ලියා පැහැදිලි කරන්න. (ල. 6)

# History - II
# ඉතිහාසය - II

Name:- ............................................ Class: -........................... Index no: - ....................................

01) (අ) (i)



## History - II
## ඉතිහාසය - II

Name:- ............................................ Class: -............................ Index no: - .....................................

01) (ඈ) (ii)

